# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2287/27 - 2022 ජූලි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2022.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බලතල පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ඇ) ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 2(2) වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට සහය වීම පිණිස පත්කර ඇත්තා වූ පහත උපලේඛනයේ ඇතුළත් එහි I වැනි තීරුවේ නම සඳහන් අනුරූපීව II තීරුවේ සඳහන් තනතුර දරන්නන් වෙත එහි උපලේඛනයෙහි III තීරුව යටතේ නිශ්චිතව විස්තර වන බලතල 2022.07.04 දින සිට ක්‍රියාත්මක වන පරිදි පවරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී,
පීඑච්ඩී (ගෞරව) එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

වර්ෂ 2022ක් වූ ජූලි මස 04 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

## I වැනි උපලේඛනය

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|---|
| 1) | හඳුවලගේ දුලාශිනී අසිංසලා සෙනෙවිරත්න | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ. II) | බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ අංක 02(3), 4, (4(2) හැර), 5, 6, 7, 8, 33, 43 (අ), 43(ආ), 44, 45, 46, 47, 50, 52, 53, 54, (54(2) හැර 58(2), 59, 67, 68, 69, 74 හා 76 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාරවරයා සතු බලතල සහ 1972 අංක 05 දරන සමුපකාර රීති මාලාවේ 4, 11, 15, 16(II), 19, 22(II), 27, 32, 37, 39, 40, 41, 42, 49, 52 හා 53 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාරවරයා සතු බලතල. |
| 2) | දිසානායක ජයවීර ගස්පේ රාලලාගේ යශ්මි අයෝධා දිසානායක | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ. III) | |
| 3) | බද්දෙවත්ත සිංහාරගේ ගීත්මා ගිම්හානි | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ. III) | |

EOG 07 - 0033

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.